# පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවි ශිෂ්ටාචාරයක අලුත් ආරම්භයක්

*පොළොන්නරුව දිසාපති*
*යූ. ජී. ජයසිංහ විසිනි*

පොළොන්නරුව කෘෂි ශිෂ්ඨාචාරය හෙළ ඉතිහාසය තරම්ම ඈතට දිවෙන අතර, ක්‍රි. ව. 12 වන සියවස මහ පැරකුම්බා දවස පොළොන්නරුව කෘෂි ශිෂ්ඨාචාරයේ පමණක් නොව ලංකා ඉතිහාසයේ ද ස්වර්ණමය යුගය බව ඓතිහාසික වශයෙන් පිළිගත් කරුණකි. ක්‍රි. ව. 1153 සිට 1186 තෙක් පුලතිසි පුරවරය සිය රාජධානිය කර ගත් මහා පරාක්‍රමබාහු රජ දවස "අහසින් වැටෙන එකද දිය බිඳක් ප්‍රයෝජනයට නොගෙන මුහුදට යාමට ඉඩ නොදෙව්" යන වදන පෙරදරි කොට ගෙන මුලු පුලතිසියම කෙත්වතු වලින් බබුලුවා විදෙස් රටවලට පවා සහල් යැවූන බවට ඉතිහාසයේ සඳහන් වෙයි.

ස්වර්ණමය යුගයත් සමග කෙමෙන් එළඹියේ අඳුරුමය කාල පරිච්ඡේදයකි. 13, 14 සියවස්හි සොළී, පාණ්ඩ්‍ය, කේරල ආදී දකුණු ඉන්දීය ආක්‍රමණිකයන්ගේ කුරිරු පහරදීම් නිසා වැව්, අමුණු කෙත්වතු හා ජනාවාස හැම විනාශ විය. බිඳුණු වැව් අමුණු, වසාගෙන මහ වනය පැතිරින. මැලේරියාව වැනි වසංගත පැතිරීම නිසා ජනාවාස කේන්ද්‍රයක්ව පැවතුන පුලතිසිය ජනශූන්‍ය පෙදෙසක් බවට පත් විය. විසිවන සියවස වන විට මුලු දිස්ත්‍රික්කයේම ඉතිරිව සිටියේ පවුල් 1300ක් පමණය. 1931 ජන සංඛ්‍යාව 7907 ක් පමණි.

1815 දී බ්‍රිතාන්‍යයන් විසින් මුලු හෙළයම සිය අණසකට ගැනීමත් සමගම ත්‍රිකුණාමලය කේද්‍රන යෙන් ඊසාන දිසාවේ කොටසක් ලෙසටත්, 1833 දී නැගෙනහිර පළාතේ කොටසක් ලෙසත්, 1873 දී අලුතින් කඩා වෙන් කෙරුන උතුරු මැද පළාතේ කොටසක් ලෙසත් තමන්කඩුව දිසාව නමින් හැඳින්වුන පොළොන්නරුව පාලනය කෙරින.

1927 දී පත් කෙරුන ඉඩම් කොමිසමේ වාර්තාව 1929 පිටවීමත්, 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණ යටතේ අභ්‍යන්තර පාලනය හා සංවර්ධන කටයුතු කෙරෙහි ලාංකිකයන්ට වැඩි බලතල පැවරීමත් සමග සියවස් හතක් පමණ අඳුරේ පැවති පුලතිසිය නැවතත් ජනාවාස වන්නට විය. එසේ සියවස් හතක අඳුරු ඉතිහාසය නැවත වෙනස් කරනු ලැබුයේ "මහ ගොවි ජනපද" සංකල්පය නිසයි.

පොළොන්නරුව ගොවි ශිෂ්ඨාචාරයේ නව යුගයේ ආරම්භයට බලපෑ වැදගත්ම සිද්ධිය ලෙස මා දකිනුයේ 1929 ඉඩම් කොමිසමේ නිර්දේශයන්ය.

එස්. ඔබේසේකර ශ්‍රීමතානන්ගේ සහභාගිත්වයෙන් එලිදුටු ඉඩම් කොමිසමේ සාමාජිකයින්ව සිටි අය අතර, සර් ඩී. බී. ජයතිලක, ඩී. ඇස්. සේනානායක, පී. බී. රඹුක්වැල්ල, එච්. එම්. මාකන් මාකර්, ඒ. එෆ්. මොලමුරේ වැනි ජාති හිතෛෂීන් සිටීම නිසා ඔවුන්ගේ ජාති හිතෛෂී චින්තනය සැබෑවක් කරමින් පුලතිසියේ නව ගොවි ශිෂ්ඨාචාරය බිහිවින.

1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වීමත් සමග කෘෂිකර්ම සංවර්ධනය පිළිබඳ වගකීම ඩී. ඇස්. සේනානායකයන් වෙත පැවරිනි. ඒ සමගම 1929 ජාතික ඉඩම් කොමිසමේ නිර්දේශයන් ක්‍රියාත්මක විනි.

> "රජයේ ඉඩම් යනු ප්‍රජාවගේ අමිල සම්පතයි. එහෙයින්ම මුලු ප්‍රජාවම වෙනුවෙන් මුලු ප්‍රජාවගේ භාරයක් ලෙස ඉඩම් නමැති මෙම සම්පත හැසිරවීම රජයේ පරම යුතුකමයි."

යනුවෙන් ඉඩම් කොමිසමේ සඳහන් මූලික පරමාර්ථයන් ක්‍රියාවට නැංවීම ඇරඹින.

1929 ඉඩම් කොමිසමේ ඉහත මූලධර්මය ඉස්මතු වන අයුරින් රජරට ඉඩම් සංවර්ධනය 1933 මින්නේරි ගොවිජනපද ව්‍යාපාරයේ ආරම්භයත් සමගම සිදු විය. ඉතිහාසයේ රන් අකුරින් ලියැවෙන එම අවස්ථාව පිළිබඳව මින්නේරි ගොවි ජනපදයේ වයෝවෘද්ධ ගොවි මහතෙකු 1981 වසරේ දී මා සමග කළ ප්‍රකාශයක් ඒ අයුරින්ම පහත දක්වේ.

> "මගේ නම රත්නායක මුදියන්සේලාගේ ජිනදාස බණ්ඩා. වයස අවු. හැටයි. එක්දහස් නවසිය තිස්තුනේ අප්‍රේල් මස තිස්වන දින මගේ පියා ආර්. එම්. රංහාමි සමග කුරුණෑගල කල්තොටේ සිට පැමිණියා. මහනුවර, කෑගල්ල, කුරුණෑගල දිස්ත්‍රික්ක තුනෙන් මින්නේරි ජනපදයට ඉල්ලුම් පත්‍ර කැඳෙව්වා. කුරුණෑගල කච්චේරියේ දී ඉඩම් කච්චේරියක් පැවැත්වුවා. අප්‍රේල් තිස් වෙනිදා කෝච්චියෙන් හතමුනට ආවා. 1933 මැයි පළමුවෙනිදා උදේ හතයි තිස්පහට නැකතට වල් කොටන්ඩ එන්න කීවා. එතකොට ඩී. ඇස්. සේනානායක මහතා පිටරට ගිහින්. එතුමා වෙනුවෙන් එදා ආවේ සර් ජෝන් කොතලාවල මහත්තයා. පොරෝපාර හැත්තෑ දෙකක් ගහලා 'බොර දවුලු' ගහක් කොතලාවල මහත්තයා කැපුවා. කුරුණෑගල දිස්ත්‍රික්කයේ අපි ඔක්කොම ඉස්සර වෙලාම කැපුවේ දොරටියාවගේ ඉඩම. . . . අත්තන් ක්‍රමයට කැපුවා. සතියකට රුපියල් එකයි ශත විසිපහක්

ආණ්ඩුවෙන් දුන්නා. බඩු සපයා ගෙන වාඩිවල උයාපිහාගෙන කෑවා. පොල් ගෙඩියක් කුරුණෑගල ශතයයි. හතමුනදී ශත තුනයි. . . . මුලින් අපි හාරසීයක් ආවා . . . . ලංකාවේ පළමුවන සිංහල ඒජන්ත වික්‍රමසිංහ මහත්තයා අනුරාධපුරේ සිට ආවා. දියා හාමුදුරුවෝ සිල්වා මහත්තයාත් සිටිය. . . . . අගෝස්තුවේ කැලේ කපලා ගිනි තියලා ඔක්තෝම්බරයේ වගා කළා. බුසලට හැටක සරු අස්වැන්නක් ලැබුණා. පොළොන්නරුවේ සිට අශ්වයා පිටින් ඩී. ඇස්. සේනානායක මහතා අපි බලන්න ආවා."

1933 මැයි මස පළමු වන දින හිඟුරක්ගොඩ බුබුල නමැති ස්ථානයේ දී (මෙම ස්ථානය සිහිවීම් වස් ශිලා ස්තම්භ පුවරුවක් 1981 දී ස්වර්ණභූමි ඔප්පු ප්‍රදාන ආරම්භ උළෙලේදී නිරාවරණය කරන ලදී. හිඟුරක්ගොඩ නගරයේ සිට සැතපුම් එකහමාරක් දුරය.) ඉහත සඳහන් අයුරු ඇරඹුන පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මහා ගොවිජනපද ව්‍යාපාරය සරු පොළොව මත අතු රිකිලි දා වැඩෙන යෝධ වෘක්ෂයක් ලෙස දිස්ත්‍රික්කය වසා අද පැතිර ඇත.

මින්නේරිය, පරාක්‍රම සමුද්‍රය, ගිරිතලේ, ඇලහැර, කවුඩුලුවැව වැනි මහ වැව් හා පැරණි ඇල මාර්ග පද්ධතිය නැවත සකසා මහගොවි ජනපද අරඹා ගොවි ජනතාව පදිංචි කරවා 1933 න් ඇරඹී දශක හතරක කාලය තුළ දිස්ත්‍රික්කයේ යෝධ සංවර්ධනයක් ක්‍රියාත්මක කෙරිණි.

මහවැලි සංවර්ධන වැඩ සටහන දිවයිනේ කෘෂිකාර්මික ආර්ථිකයේ විප්ලවයක් ඇති කළ නව ව්‍යාපෘතියක් ලෙස නම් කළ හැකි අතර මහවැලි සංවර්ධන වැඩසටහන මගින් පොළොන්නරුව දිස්ත්‍රික්කයට ඇති කළ බලපෑම ඉමහත්ය. 1981 ඉදිකිරීම් ඇරඹුන මාදුරුඔය යෝධ ජලාශය මගින් මාදුරුඔය වම් ඉවුර යටතේ සංවර්ධනය කෙරුන අක්කර 30,000ක් දැනටමත් 'බී' කලාපයේ ගොවිතැන සඳහා යෙදවෙයි. මහවැලි 'බී' කලාපයේ 'ජී' කොට්ඨාශය වශයෙන් දැනට හැඳින්වෙන අක්කර 13,000ක බිම් ප්‍රමාණයක් මහවැලිය යටතේ ඇලහැර සංවර්ධනය වී ඇත.

1933න් ඇරඹී පසුගිය දශක හය ඔස්සේ කෘෂිකාර්මික සංවර්ධනයේ මාවත තුළින් අද දිස්ත්‍රික්කයේ වගාව සඳහා යොදා ඇති බිම් ප්‍රමාණය පහත දැක්වෙයි.

| | |
|---|---|
| මින්නේරිය ව්‍යාපාරය | 18,000 |
| ගල් අමුණ ව්‍යාපාරය | 4,000 |
| පරාක්‍රම සමුද්‍රය ව්‍යාපාරය | 25,000 |
| ගිරිතලේ ව්‍යාපාය | 7,500 |
| කවුඩුලුවැව ව්‍යාපාය | 12,000 |
| මහවැලි 'බී' කලාපය | 30,000 |
| මහවැලි 'බී' කලාපයේ 'ජී' කොට්ඨාශය (ඇලහැර) | 13,000 |
| වෙනත් සුළු වාරිමාර්ග ක්‍රම | 5,000 |
| වැසි ජලයෙන් | 5,000 |
| | 1,19,500 |

යල මහ දෙකන්නයේම මහවැලි ජලයෙන් පෝෂණය වන පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මාස් කන්නය තුළ ඉහත සඳහන් මුළු බිම් ප්‍රමාණයම වගා කරන අතර වර්ෂා පෝෂිත හා සුලු වාරිමාර්ග හැර මුලු බිම් ප්‍රමාණයෙන් 75%කට වැඩි බිම් ප්‍රමාණයක් යල් කන්නයේ දී ද වගාව සඳහා යොදාගනී.

දිවයිනේ කෘෂිකාර්මික ප්‍රදේශයන් අතර අද පෙරමුණේ සිටින පොළොන්නරුවෙන් මාස් කන්නයේ දිවයිනේ මුලු වී නිෂ්පාදනයෙන් 11%ක් හෙවත් බුසල් ලක්ෂ 85ක් ද, යල් කන්නයේ මුලු දිවයිනේ නිෂ්පාදනයෙන් 16%ක් හෙවත් බුසල් ලක්ෂ 65ක් පමණ ද නිපදවීම පොළොන්නරු ගොවි ජනතාව ලද ජයග්‍රහණයකි.

අද ලබා ඇති "ගොවි ජය" දුෂ්කර ගමනක් තුළින් "මහ ගොවි ජනපද" ව්‍යාපෘති ඔස්සේ සිදු වූවකි.

පහත දැක්වෙන දිස්ත්‍රික් ජන සංඛ්‍යාව හා ඩී. ඇස්. සේනානායකගේ ප්‍රකාශයන් ඒවා සනාථ කරයි.

| | | |
|---|---|---|
| 1931 | මුලු ජන සංඛ්‍යාව | 7,909 |
| 1946 | ,, | 20,809 |
| 1953 | ,, | 58,014 |
| 1963 | ,, | 1,13,971 |
| 1971 | ,, | 1,63,653 |
| 1981 | ,, | 2,61,563 |
| 1991 | ,, | 4,20,000 |
| | | (ඇස්තමේන්තු) |

1933 සිට 1953 තෙක් මින්නේරි, ඇලහැර, පරාක්‍රම සමුද්‍රය, ගිරිතලේ ජනපද ව්‍යාපාර ඇරඹුන දශක දෙකක කාලය තුළ අට ගුණයකින් ජනගහන වර්ධනයක් සිදුවීම විශේෂ සිද්ධියකි.

කෘෂිකර්ම හා ඉඩම් ඇමති ඩී. ඇස්. සේනානායක මහතාගේ අත්සනින් 1942 අගෝස්තු 29 දිනැතිව ගොවි ජනතාව වෙත බෙදා දෙන ලද "මින්නේරිය වගා කිරීමේ ව්‍යාපාරය ගැන හැඟීම් ස්වල්පයක්" යන පොත් පිංචෙන් උපුටා ගත් කොටස් පහත දැක්වෙයි.

1933 වර්ෂයේ දී රාජ්‍ය මන්ත්‍රණ සභානායක සර් ඩී. බී. ජයතිලකතුමා ආණ්ඩුවේ අයවැය ව්‍යවස්ථාව ඉදිරිපත් කරද්දී මෙසේ කීවේය. "සභාපති තුමනි, මින්නේරිය වගා කිරීම පිළිබඳ කරනු ලබන අත්හදා බැලීම හෙවත් ප්‍රයත්නය ගැන වචනයක් කියනු කැමැත්තෙමි. ඒ වනාහී අතිවිශාල පරීක්ෂණයක් හෙවත් අත්හදා බැලීමක් බවත්, මෙතෙක් එහි කටයුතු සාර්ථක ලෙස, කෙරී ගෙන යන බවත්, ඒ පිළිබඳ වාර්තා වලින් ඔප්පු වේ. මීලඟ මැලේරියා මාරයා පැමිණි විට මේ තත්ත්වය වෙනස් වේදැ යි කිව නොහැකිය. එහෙත් එවැනි විපතක් ඇති නොවේවායි අපගේ විශ්වාසයයි. මැලේරියා රකුසා මැඩ පැවැත්වීමට සියලු විධිවිධාන ගොවිකම් දෙපාර්තමේන්තුවත්, සෞඛ්‍ය දෙපාර්තමේන්තුවත් විසින් සලසනු ලැබේ යයි ද, මේ අත්හද බැලීමේ ප්‍රතිඵල සම්පූර්ණයෙන්ම සතුටුදයක වන්නේ යයි ද අපේ බලාපොරොත්තුවයි. ඒ එසේ වූවහොත් මගේ හැඟීම නම් අපට බලවත් ශක්තියක් එමගින් නොඅනුමානවම අත්වන්නේය" යනුයි.

කෘෂිකර්ම හා ඉඩම් ඇමති ඩී. ඇස්. සේනානායක විරුවාණෝ 1942 අගෝස්තු 29 දින :

"දැන් ඉතින්, මින්නේරි ව්‍යාපාරය අත්හද බැලීමක් නොවේ. එය සඵලවත් වූ බව ප්‍රත්‍යක්ෂ ලෙසට තේරුම් ගැනීමට දැන් පුලුවන ...... මෙතෙක් මා අත්දුටු දෙයින් මට පෙනී යන්නේ මේ ගොවීන් විසින් විඳින ලද දුක් හිරිහැර හා ව්‍යවසනයන්ගෙන් වැඩිහරියක් මග හරවා ගත හැකිව තිබුන බවය ...... ජනපදයේ වර්තමාන තත්ත්වය, එහි ඇති අලංකාර ගොඩනැගිලිත්, වාසනාවන්ත පෙනුමෙන් යුත් වැසියනුත්, දකින විට හිතේ මහත් ප්‍රීතියක් ඇති වේ. නමුත් මේ තත්ත්වයට පැමිණීමට එහි ගොවියන් විඳි කටුක දුක් අප්‍රමාණයි. සමහරුන්ට මින්නේරියේදී දුක් හිරිහැර පීඩා මිස වෙන කිසිවක් ලබා ගන්ට නොහැකි විය. තව සමහරු මාස ගණන්, අවුරුදු ගණන්, දුක් විඳීමෙන් පසුව, තව දුක් ඉවසන්ට නොහැකිව ජනපදය අත්හැර ගියහ. සමහරුන්ට එහිදී අකාලයේ මිය යන්නට සිදු විය. අනිත් සමහරුන්ගේ භාර්යාවන්ද, දරුවෝද මරුමුවට පත් වූහ. අහෝ ඛේදයකි! ...... තව බොහෝ කල් යන තෙක්ම අපේ ආදයම ප්‍රධාන වශයෙන්ම ගොවිතැනින්ම ලැබිය යුතු වන්නේය. අස්වැද්දීමට ඉඩම් ද, ඊට උවමනා වැසියෝද අපට ඇත. දූරදර්ශී වූ ක්‍රියා මාර්ගයන් යෙදුවහොත් අපේ රටේ අනාගත අභිවෘද්ධිය ඒ මගින් නොඅනුමානවම සැලසෙන බව වටහා ගත යුතුය ...... මිනිසුන්ට එමගින් ඇති වන ශක්තියත්, සැපතත් මුදලින් ප්‍රමාණ කල හැකි නොවේ. "

ඩී. ඇස්. සේනානායක චින්තනයෙන් පෝෂණය ලැබ, සී. පී. ද සිල්වා වැනි විරුවන්ගේ කැපවීම් තුළින් බාධක මැඩගෙන ස්ථාවර අඩිතාලමක් මත දහස් සංඛ්‍යාත ගොවි විරුවන්ගේ ඩහදිය මහන්සියෙන් පොළොන්නරු ගොවි සංස්කෘතිය බිහිවිය. රටට බත සපයන පුලතිසි ගොවි ජනතාවට ජාතියේ උපහාරය පිදීම කළගුණ සලකන හෙළ දරුවන්ගේ යුතුකමකි.